# බය නැති තෙල් කූඹි පැංචා




**D.M. දිනුලි උමේදී දිසානායක.**

**5 ශ්‍රේණිය D**

**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

කතෘ

***D.M. දිනුලි උමේදී දිසානායක***

චිත්‍ර

***D.M. දිනුලි උමේදී දිසානායක***

කෘතියේ අයිතිය

***D.M. දිනුලි උමේදී දිසානායක***

මුද්‍රිත දිනය

*2023 නොවැම්බර්*

**ISBN 978-624-206-810-7**

# පිදුම

ආදරණීය තාත්තාට, අම්මාට,

සිප්සතර

කියා දෙන

දයාබර ගුරුවරුන්ට

සහ

කියවීමට කැමති

සියලුම දෙනාට ..........

# පෙරවදන

වත්මන් අධ්‍යාප්තයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුර වැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතාහඳුනා ගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායාදියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාප්ත අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමී

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යඛන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නත් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි


ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

## තෙල් කූඹි පැංචයි වලස් පැංචයි ගජ යාලුවෝ.





දවසක් මේ දෙන්නා
ඉස්කෝලේ ගිහින් ආපසු
ගෙදර යමින් හිටියා.

එක පාරටම කවුදෝ

“ මම යකෙක් ”

කියාගෙන මේ දෙන්නා

මැදට පැන්නා.

ඒ කොට්රාළු.



බයවුණු වලස් පැංචා පස්ස නොබලා... දුවන්න පටන් ගත්තා...



ඒත් තෙල් කූඹි පැංචා නම් පොඩ්ඩක්වත් බය වුණේ නැහැ.





එයාට වලස් පැංචා ගැන
හරිම දුකයි.

කලබලේට දුවන්න
ගිහිල්ලා වැටිලා තුවාල
කරගෙන ද දන්නේ නෑ.
කූඹි පැංචට හිතුණා.

# එයාට හොඳටම කේන්ති ගියා.





එක පාරටම කොටිරාළගේ
ඇඟට පැනලා දිගට
හරහට විදින්න ගත්තා.

කොටිරාළට හොඳටම
රිදුණා.

පුංචි වුණාට  බය නැති
පුංචි තෙල් කූඹි පැංචට
බයේ කොටිරාළ කැලේ
කඩාගෙන දිවුවා.



ඉතින් යාලුවනේ, අපි මේ කථාව ආදර්ශමත් කරගෙන නොබියව අභියෝගවලට මුහුණ දෙමු.



නිමි

# <u>පසුවදන</u>

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහාඅධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔනෑවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝද්යක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මාවිසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනාකරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හාඑක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වාවිවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායාදියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිව්යය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසී ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

**රචනා කළේ - D.M. දිනුලි උමේදි දිසානායක**

**මහාමයා බාලිකා විදුහල - මහනුවර**



Bar code :

9 786242 068107